// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2207/7 - 2020 දෙසැම්බර් මස 23 වැනි බදාදා - 2020.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

එල්.ඩී.බී. 25/1973.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමඟ කියවිය යුතු 41 වන වගන්තිය යටතේ තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නාමල් රාජපක්ෂ,**
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත පරිදි 2016 ඔක්තෝබර් මස 27 වන දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි 8 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:—

"8. එහි (1) (අ) ලියාපදිංචි කරන ලද ජාතික ක්‍රීඩා සංගමයක යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණය ලැබී හෝ ක්‍රියාව ලැබීමෙන් දින හතක් ඇතුළත අමාත්‍යවරයා වෙත ලිඛිතව අභියාචනය කරනු ලැබිය හැකි ය.

(ආ) එකී අභියාචනය සනාථ කිරීම සඳහා අදාළ සියලු කරුණු ද ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට ගෙවන ලද රුපියල් පන්දහසක ආපසු නොගෙවනු ලබන මුදල (ක්‍රීඩකයන් තෝරාගැනීම සම්බන්ධයෙන් වන අභියාචනා හැර) ගෙවූ බවට වන ලදුපත ද එම අභියාචනය සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අභියාචනයක් ලැබීමෙන් පසු, අමාත්‍යවරයා විසින් එම අභියාචනය මේ නියෝගයේ (3) වන උප නියෝගයේ දක්වා ඇති අභියාචන උපදේශක කමිටුව වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(3) (අ) අමාත්‍යවරයා විසින්, අභියාචනය සලකා බැලීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් නිර්දේශ තමා වෙත ඉදිරිපත් කිරීම සඳහා සාමාජිකයන් හත්දෙනකුගෙන් සමන්විත අභියාචන උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය. එම කමිටුවේ සාමාජිකයන් විසින් දෙනු ලබන කිසිදු නිර්දේශයකට අමාත්‍යවරයා සීමා නොවිය යුතු ය.

(ආ) (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) අභියාචන උපදේශක කමිටුව, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකුගෙන්, නීති ක්ෂේත්‍රයේ පුළුල් දැනුමක් සහ අත්දැකීමක් ඇති තැනැත්තන්ගෙන් සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනය සඳහා දායකත්වය ලබා දී ඇති තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(ඇ) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයා කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී සාමාජිකයන් විසින්, රැස්වීමේ මුලසුන දැරීම සඳහා සාමාජිකයකු තෝරාපත් කරනු ලැබිය යුතු ය.

(ඈ) අමාත්‍යවරයා විසින් කමිටුව වෙත අභියාචනයක් යොමු කරනු ලබන අවස්ථාවක දී, සභාපතිවරයා විසින් එම අභියාචනය සලකා බැලීම සඳහා සහ අභියාචනය යොමු කරන ලද දින සිට දින දාහතරක් ඇතුළත ඒ පිළිබඳ අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවේ සාමාජිකයන් අතරින් යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනකු පත් කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, අදාළ සියලු කරුණු සලකා බැලීමෙන් පසු එම අභියාචනය ලැබී එක් මසක් ඇතුළත අභියාචකට සහ අදාළ ජාතික ක්‍රීඩා සංගමයකට සිය තීරණය දැනුම් දිය යුතු ය.".

(2) 10 වන නියෝගයේ "දූෂණය" යන යෙදුමට ඉක්බිතිව ම පහත දැක්වෙන යෙදුම ඇතුළත් කිරීමෙන්:-

" "ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, ක්‍රීඩා පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;".

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.